# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2075/31 - 2018 ජුනි මස 14 වැනි බ්‍රහස්පතින්දා - 2018.06.14**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත**

2 වැනි වගන්තිය යටතේ නියමය

2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය මංගල සමරවීර වන මම, මෙහි උපලේඛනයේ I වන තීරයේ නිශ්චිතව දක්වා ඇති වෙළඳ භාණ්ඩ සම්බන්ධයෙන් ඒ උපලේඛනයේ II වන තීරයේ අනුරූප සටහන් වල නිශ්චිතව දක්වා ඇති අනුප්‍රමාණ මත විශේෂ වෙළඳ භාණ්ඩ බද්දක්, මෙම නියමය මගින් පනවමි.

මෙම නියමය 2018 ජුනි මස 14 වැනි දින සිට ආරම්භ වන වසරක කාල සීමාවක් සඳහා, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන වලට යටත්ව, වලංගුව පැවතිය යුතුය.

2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ පනවන ලද 2018.03.19 දිනැති අංක 2063/13 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් සංයෝජිත වර්ගීකරණ අංක 0713.31.29 යටතේ වන උඳු සඳහා ප්‍රකාශිත අදාළ නියමයන් 2018 ජුනි මස 14 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි අවලංගු කරමි.

මංගල සමරවීර,  
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය.

2018 ජුනි මස 13 වැනි දින,  
කොළඹ 01,  
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ දී ය.


1A - PG 4081 - 532 (2018/06)



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

### උපලේඛනය

| I වන තීරය | | | | II වැනි තීරය |
|---|---|---|---|---|
| වෙළඳ භාණ්ඩය | | | | විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද |
| | සං.ව. ශීර්ෂය | සං.ව. සංකේතය | විස්තරය | |
| 01 | 03.03 | | 03.04 ශීර්ෂයේ කටු ගැලවූ මසුන් සහ අනෙකුත් මසුන්ගේ මස් හැර, හිමායිත මසුන් | |
| | | 0303.89.90 | අනෙකුත් - තලපත් (Istiophorus platypterus), කොප්පරා මසුන් (Makaira spp) සහ තෝරා මසුන් (Narrow-barred Spanish mackerel/Scomberomorus commerson) පමණක් | කි.ග්‍රෑමයට රු. 25.00 |
| 02 | 08.01 | | අළුත් හෝ වියළි, පොතු ගැලවූ හෝ නොගැලවූ හෝ ලෙලිගැසූ හෝ නොගැසූ, පොල්, බ්‍රසීල ගෙඩි සහ කජු ගෙඩි | |
| | | 0801.19.90 | අනෙකුත්-පොල් මද | කි. ග්‍රෑමයට රු. 100 |
| 03 | 07.13 | 0713.31.29 | අනෙකුත් - උඳු | කි. ග්‍රෑමයට රු. 150.00 |

06 - 1088

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.